
# හොඳම දේ



W.M ජේනාදි සෙසත්යා

# හොඳම දේ

## ඩබ්.එම්.ජේනාදි සෙසත්යා වික්‍රමසිංහ

පාසල : මහමායා බාලිකා විද්‍යාලය, මහනුවර

ඉගෙනුම ලබන පංතිය : **3 -B**

කෘතිය පළ කරන දිනය : **2026. 05. 28**

| | | |
|---|---|---|
| කෘතියේ නම | : | '' හොඳම දේ '' |
| කතෘගේ නම | : | ඩබ්.එම්.ජෙනාදි සෙසත්යා වික්‍රමසිංහ |
| කතෘගේ වෙනත් කෘති | : | මලිගේ කතාව |
| කෘතිය පළ කරන දිනය | : | **2026. 05. 28** |
| ප්‍රථම මුද්‍රණය | : | **2026. 05. 28** |
| ලිපිනය | : | **18/A,** සිරිමල්වත්ත, ගුන්නෑපාන. |
| **ISBN** අංකය | : | **978-624-211-328-9** |
| මුද්‍රණය | : | **' The PRESS'**<br>කොටුගොඩැල්ල වීදිය,<br>මහනුවර |

# පිදුම

**මාගේ මහාමායා විදු මවට**

**ආදරයෙන් පුදමි**

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදනම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ  දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වු පාසල් දරුවන් මඟපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# ස්තුතිය

මට මේ පොත ලස්සනට ලියන්න කියල දීල උදව් කළ මගේ ඉස්කෝලේ සියලුම ගුරු මෑණිවරුන්ටත්, මගේ අම්මා, තාත්තා ඇතුළු පවුලේ සියලු දෙනාටත් මම ගොඩක් ස්තුති වන්ත වෙනවා.

ඩබ්.එම්.ජෙනාදි සෙසත්යා වික්‍රමසිංහ වන මාගේ මෙම නිර්මාණය ඔබ සියලු දෙනාට රසවින්දනය කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරමි.


කතෘගේ නම : ඩබ්.එම්.ජෙනාදි සෙසත්යා වික්‍රමසිංහ


ලිපිනය :18/A, සිරිමල්වත්ත, ගුන්නෑපාන.

දුරකතන අංකය : 076 -8788753

ගොවි මාමාගේ පලතුරු වත්තේ පුංචි පලතුරු බබාලා හරිම සතුටින් ලොකු වෙමින් සිටියා.



"මේ පලතුරු ඉක්මනට ලොකු කරලා හොඳ අස්වැන්නක් ගන්න නම් තෙල් පොහොර ටිකක් ගහන්න ඕනෑ " ගොවි මාමා කල්පනා කළා.




''ගොවි මාමා අපිව වස විස ගහලා ලොකු කරන්නයි හදන්නේ '' අන්නාසි බබා කීවා.

''අනේ... අපි මැරෙයි ද? අඹ බබා ඇහුවා.

''අනේ මන්දා...අපිට මොනවා වෙයිද '' කියලා පැණි දොඩම් යාළු කීවා.



එක දවසක් ගොවි මාමා හරිම ගඳ තිත්ත රස දියර වර්ගයක් පලතුරු බබාලාගේ ඇඟට ඉහලා ගියා. පලතුරු බබාලා හිටියේ හොඳටම බය වෙලා.



ටික දවසක් යනකම් පලතුරු යාළුවන්ට ඇස් ඇරින්නත්, කතා කරන්නත් අමාරු වුණා. ඒ වගේම වෙනදට එන සමනල්ලු, කුරුළු යාළුවෝ ආවෙත් නෑ.



ගොවි මාමාගේ පුතා බන්ටිටත්, පලතුරු වත්තෙන් එන මේ විස ගඳ දැනුණා. අනේ අපේ තාත්තා ඉක්මනට පලතුරු ලොකු කරගන්න ඕන නිසා විස තෙල් පොහොර ගහලා.

"වස විස දාපු ආහාර කන්න එපා, ලෙඩ හැදෙනවා කියලා අපේ පන්තියේ ගුරුතුමිත් කියලා දුන්නා."



"ඇයි තාත්තේ අපේ පලතුරු වත්තට විස තෙල් ගහන්නේ ? මේවා කලා අපි හැමෝම ඉක්මනට ලෙඩ වෙලා මැරෙයි "

අපි විස තෙල් පොහොර වෙනුවට ස්වාභාවික පොහොර වලින් පලතුරු වගා කරමු"



ගොවි මාමායි, බන්ටි බබයි එකතු වෙලා ගෙදර ඉවත දමන කෑම, පොතු, ගස්වල කොළ වගේ ස්වාභාවික දේවල් එකතු කරලා කොම්පෝස්ට් පොහොර වළක් හදන්න පටන්ගත්තා.



ගොවි මාමා ඒ කොම්පෝස්ට් පොහොර ආපහු පලතුරු වගාවට දැම්මා. පලතුරු බබාලා හොඳට ආදරයෙන් බලාගත්තා.



පලතුරු බබාලාට හරිම සතුටුයි. ආපහු එයාලා ලස්සනට, සරුවට වැඩුණා. ආයෙත් සමනල්ලු, කුරුල්ලෝ වත්තට එන්න පටන්ගත්තා.



තමන්ගේ පුතාගේ බුද්ධිමත්කම නිසා වස විස නැති පලතුරු වගාවක් හදන්න පුළුවන්වීම ගැන ගොවි මාමා ගොඩක් සතුටු උණා.

''පුංචි අපිත් වස විස නැති ආහාර ගන්න පුරුදු වෙන්න ඕන. ඒක අපි හැමෝටම වැදගත් නිරෝගීව ඉන්න'' බන්ටි සිතුවා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කරුවන් දැයට දායාද කල මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් ''**හේමමාලා උපහාර** '' ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලුම දෙනාටද, දියවඩන නිළමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)